# 5. ජේසුස් වහන්සේගේ ළමා කාලය

**ජේසුස් වහන්සේ තම ළමා කාලය දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාදය ලබමින් වැඩුණු සේක. උන්වහන්සේ ජෙරුසලම් දේව මාලිගාව, තම පියාණන්ගේ ගෘහය සේ සැලකූ සේක. එතුමා සතු වූ ආගමික දැනුම ද පුදුමාකාරය. ඒ පිළිබඳව දැක්වෙන මෙම පාඩමෙන් කිතුනු දරුවන් වන අපගේ ජීවිතවලට ගෙනෙන ආදර්ශය විමසා බලමු.**

**කියවා බලමු**

**ශු. ලූක් 2: 39-52**





5.1 රූපය - ජේසුස් වහන්සේ දේව මාලිගයේ පඬිවරු සමග

ජේසුස් වහන්සේ වයස අවුරුදු දොළහේ දී මරිය තුමිය හා ජෝසෙප් තුමා සමග ජෙරුසලමේ දේව මාලිගාවට ගිය සේක.

ජේසුස් වහන්සේ එසේ ගියේ යුදෙව් ව්‍යවස්ථාව අනුව වයස අවුරුදු දොළහේ පිරිමි දරුවකු වැඩිහිටියකු ලෙසට පිළිගැනුණ නිසා ය. එතැන් පටන් දේව මාලිගාවේ දී නමස්කාර කිරීමට ද අධ්‍යාපනය ලැබීමට ද දේව මාලිගාවේ පැවැත්වෙන මංගල්‍යයන්ට සහභාගි වීමට ද ඔවුන්ට අවස්ථාව සැලසෙන හෙයිනි.

ජේසුස් වහන්සේ දේව මාලිගාවට වයස අවුරුදු දොළහේ දී ගිය අවස්ථාව ජුදෙව්වන්ට විශේෂ වන පාස්කු මංගල්‍ය සැමරීමේ දිනය යි. ජේසුස් වහන්සේ තම පියා, මව හා ඥතීන් ද සමග එදින ජෙරුසලම් දේව මාලිගයට ගිය සේක.

ජුදෙව් පාස්කු මංගල්‍යය යනු කිතුනු අප පවත්වන පාස්කු මංගල්‍යය නොවේ. අප පාස්කුව සේ සමරන්නේ, ජේසුස් වහන්සේ මරණයෙන් උත්ථාන වීම යි. ජුදෙව් පාස්කුව වෙනත් අර්ථයක් ගෙන දුන් වැදගත් මංගල්‍යයක් විය.

ජුදෙව් පාස්කුව, ඔවුන්ගේ ඉතිහාසයේ විශේෂ අවසථාවක් මෙනෙහි කරන ආගමික මංගල්‍යයකි. අතීතයේ ඉශ්‍රායෙල් ජනතාව ට මිසර දේශයේ වහලුන් ලෙස ට ජීවත් වීමට සිදු විය. එකල ඔවුන් තම පීඩාවන් ගැන දෙවියන් වහන්සේට කන්නලව් කළ හ. දෙවියන් වහන්සේ මෝසෙස් නම් වූ නායකයකු මගින් ඔවුන් වහල්කමින් මුදවා කානාන් දේශය, පොරොන්දු දේශයට ගෙන ගිය සේක. මෙම සිද්ධිය සමරන මංගල්‍යය, පාස්කුව හෙවත් පසුකර යාමේ මංගල්‍යය ලෙස ශුද්ධ බයිබලයේ සඳහන් වෙයි. මෙම ආගමික උත්සවයට සහභාගී වීමට සැම ජුදෙව්වකු ම ඉතා උනන්දු විය. ඔවුහු කණ්ඩායම් වශයෙන් ජෙරුසලමේ දේව මාලිගයට පැමිණුනා හ. මරියතුමිය හා ජෝසෙප්තුමා ද වයස දොළහක් වූ ජේසුස් වහන්සේ සමග ඊට සහභාගි වීමට එහි පැමිණුනා හ.

**එම ගමනේ දී සිදු වූ විශේෂ සිද්ධිය අප දැන් අධ්‍යයනය කරමු.**

එදින පාස්කුව සැමරීමට ජෙරුසලම් දේව මාලිගාවට පැමිණි මරියතුමී, ජෝසෙප්තුමා හා සියල්ලන් උත්සවය අවසන් වූ පසු නිවෙස් බලා පිටත් වූහ. නමුත් එදා ජේසුස් වහන්සේ දේව මාලිගාවේ තවදුරටත් රැඳී සිටිමින් පඬිවරුන් සමග සාකච්ඡාවේ යෙදුණු සේක. ඒ බව මරියතුමිය හා ජෝසෙප්තුමා දැන සිටියේ නැත. ඔවුහු නිවෙස් බලා යන අතරතුර දී ජේසුස් වහන්සේ නොමැති බව වැටහී ඥාතීන් අතරේ තම පුතු ව සෙව්වත් සම්බ නොවුණි. ඔවුහු උන්වහන්සේ සොයමින් මහත් දුකින් ජෙරුසලමේ දේව මාලිගාවට නැවත හැරී ආවෝ ය.

ජෙරුසලම් දේව මාලිගාවට පැමිණි විට තම දොළොස් හැවිරිදි පුත්‍රයා පඬිවරුන් සමග ප්‍රශ්න විචාරමින් ද පිළිතුරු සපයමින් ද සාකච්ඡා

කරමින් සිටිනවා ඔවුහු දුටුහ. එම පඬිවරයන් ජේසු කුමරුගේ බුද්ධි මහිමය ගැන පුදුම වුහ. එසේම ජේසුස් වහන්සේගේ දෙමාපියන් ද ඒ ගැන ඉතා මවිතයට පත් වූහ.



5.2 රූපය - ජේසුස් වහන්සේ මරියතුමිය සමග

එහි දී ජේසුස් වහන්සේ හා මරියතුමිය අතර ඇති වුණ සංවාදය ඉතා වැදගත් ය. මරියතුමිය ජේසුස් වහන්සේ අමතා "පුතා අපට මෙසේ කළේ ඇයි ද"'කියා විමසුවා ය. එයට ජේසුස් වන්සේගේ පිළිතුර වූයේ"ඔබ මා සෙව්වේ මන්ද? මා පියාණන්ගේ මැදුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?" යන්න යි.

ඉන් පසු ව ජේසුස් වහන්සේ දෙමව්පියන් සමග නාසරෙත් නුවර බලා ගිය සේක. ජේසුස් වහන්සේ මරියතුමිය හා ජෝසෙප්තුමාට ඉතා කීකරු ව තම ළමා කාලය ගත කළ බව දේව වචනයේ සඳහන් ව තිබේ.

## මෙම සිද්ධියෙන් අප සැමට වටිනා පාඩම් රැසක් ඉගෙනීමට තිබේ

- ❖ මරියතුමිය හා ජෝසෙප්තුමා තමන් සොයා ආ විට ජේසුස් වහන්සේ පැවසූ වචන මහත් මග පෙන්වීමක් ගෙන දෙයි. එනම් "මා පියාණන්ගේ මැදුරේ සිටිය යුතු බව ඔබ නොදන්නෙහි ද?" යන්න යි. ඉන් පැහැදිලි වන්නේ ජේසුස් වහන්සේ තමන්වහන්සේගේ නිත්‍ය නිවස

ජෙරුසලමේ දේවමාලිගාව ලෙස සැලකූ බව යි. එසේ ම එය දෙව්පියාණන් වහන්සේගේ ද ගෘහය යි. දෙවියන් වහන්සේ සමග ජේසුස් වහන්සේගේ තිබෙන සම්බන්ධතාව ඒ තුළින් පෙනේ. අප ද දෙවියන් වහන්සේ අපගේ දෙව්පියාණන් ලෙස සළකා නිරන්තර සම්බන්ධතාවයකින් යුතු ව ජීවත් විය යුතු වේ.

- ❖ දෙමව්පියන්ට කීකරු ව ජේසුස් වහන්සේ නාසරෙත් නුවර ජීවත් වූ සේක. එම ගුණාංගය සැම කිතුනු දරුවකුට ම ආදර්ශයක් වෙයි. දෙමව්පියන් සමග අපට තිබෙන සම්බන්ධතා වඩා සවිමත් කර ගනිමින් අපි කිතුනු දරුවන් ලෙස වර්ධනය වෙමු.

- ❖ ජේසුස් වහන්සේ ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් ද දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන් ගෙන් ප්‍රසාදය ලබමින් වැඩුනු සේක. එයින් අදහස් වන්නේ අප දෙවියන් වහන්සේ සමග මෙන්ම මිනිස් සමාජයේ අන් අය සමග ද යහපත් සබඳතාවක් පවත්වා ගත යුතු බවය.

**කටපාඩම් කරමු.**
ශු. ලූක් 2 : 51 - 52

ක්‍රියාකාරකම

1. දොළොස් හැවිරිදි ජේසුතුමා දේව සබඳතාවය වර්ධනය කර ගත් සේ ඔබට ද දේව සබඳතාවය වර්ධනය කර ගත හැකි ආකාර 3 ක් ලියන්න.

2. "මා පියාණන්ගේ ගෘහයෙහි සිටිය යුතු බව" යන ජේසු කුමරාගේ වදන ඔබ තේරුම් ගන්නේ කෙසේ ද?